# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,946- 2015 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1392 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1396 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1302 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1400 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1405 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 දෙසැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1391 - B 81013 - 5,402 (2015/12)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - ත්‍රිකුණාමලය**

රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

ත්‍රිකුණාමලය මහාධිකරණ කලාපයට අයත් මහාධිකරණය ත්‍රිකුණාමලය, මහෙස්ත්‍රාත් අධිකරණය ත්‍රිකුණාමලය සහ කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ විසින් රාජසන්තක කරන ලද සහ හිමිකම් නොපාන ලද පහත විස්තර සඳහන් රථවාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට ත්‍රිකුණාමලය මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

විකිණීමට අදළ රථවාහන 2015.12.21 වැනි දින සිට අදළ අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් මගින් කාර්යාල වේලාවන් තුලදී එකී අධිකරණ වලදී පරික්ෂා කිරීමට හැකි ය. මීට අදළ ටෙන්ඩර් අයදුම්පත් හා ලියකියවිලි ත්‍රිකුණාමලය මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් 2015.12.21 වැනි දින සිට ලබාගත හැකි ය.

2016.01.08 වැනි දිනෙන් ටෙන්ඩර් කැඳවීම අවසන් කරනු ලබන අතර 2016.01.12 වැනි දින ප. ව. 2.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ගාස්තුවක් ගෙවිය යුතු අතර අදළ පරිදි ආපසු ගෙවනු ලබන ඇති තැන්පත් මුදලක් ද ගෙවිය යුතු ය.

ත්‍රිකුණාමලය මහාධිකරණ කාර්යාලයෙන් ලබා ගන්නා ලද අයදුම්පත් හැර අනෙකුත් අයදුම්පත් හා ඡායා පිටපත් පිළිනොගෙන ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක් ටෙන්ඩර් ඉල්ලුම්කරුවෙකුට එක් රථ වාහනයකට වඩා වැඩි රථ වාහන සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර, එසේ වුව ද සියලුම රථ වාහන සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් අයදුම්පත සමග සපයනු ලැබේ.

බී. සෂි මහේන්ද්‍රන්,
මහාධිකරණ විනිසුරු,
සභාපති,
ත්‍රිකුණාමලය මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව.

2015 නොවැම්බර් මස 17 වැනි දින,
ත්‍රිකුණාමලය මහාධිකරණයේ දී ය.

**රථ වාහන පිළිබඳ විස්තරය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *විස්තරය* | *ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල රු.* | *ආදල වාහන පරීක්ෂා කළ හැකි අධිකරණය* |
|---|---|---|---|---|---|
| 01. | HCT 618/14 | EPPQ 9557 | ක්‍රීම් පැහැති ඩිමෝ බට්ටා ලොරි රථය<br>චැසි අංකය MAT445051BZR25996<br>එන්ජින් අංකය 275IDI05BYYS29271 | 5,000 | මහාධිකරණ ත්‍රිකුණාමලය |
| 02. | MC/395/MT12 | නොමැත | මිට්ෂුබිසි නිල් හා සිල්වර් පැහැති පැජරෝ රථය<br>චැසි අංකය නොමැත<br>එන්ජින් අංකය AD 56- BR 1348 | 7,500 | මහෙස්ත්‍රාත් අධිකරණය ත්‍රිකුණාමලය |
| 03. | AR/K/146/11 | NCHU 1416 | ඩයිහට්සු සුදු පැහැති ලොරි රථය<br>චැසි අංකය 5200C0002384<br>එන්ජින් අංකය - EF - 7177756 | 5,000 | එම |
| 04. | MC/47419 | EPZA 2942 | කහපැහැති බැකෝ යන්ත්‍රය<br>චැසි අංකය : 0469600<br>එන්ජින් අංකය : AA506064865162C | 10,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ |
| 05. | MC/35902 | LF/3870 | කහපැහැති ටිපර් රථය<br>චැසි අංකය : YPE 623030<br>එන්ජින් අංකය : YPE 437384 | 7,500 | එම |

| අනු. අංකය | නඩු අංකය | වාහන ලියාපදිංචි අංකය | විස්තරය | ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල රු. | ආදල වාහන පරීක්ෂා කළ හැකි අධිකරණය |
|---|---|---|---|---|---|
| 06. | MC/31929 | 50 ශ්‍රී 4382 | සුදු පැහැති වෑන් රථය<br>චැසි අංකය : LH30V367259<br>එන්ජින් අංකය - 255423 | 1,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ |
| 07. | MC/44899 | 227-7106 | සුදු පැහැති කැන්ටර් රථය<br>චැසි අංකය : NER66E-7514658<br>එන්ජින් අංකය - 4HF 1 - 523096 | 2,000 | එම |
| 08. | MC/40778 | EPLH/3068 | නිල් පැහැති ලොරි රථය<br>චැසි අංකය LVBV3JBB58E008291<br>එන්ජින් අංකය Q080602086C | 5,000 | එම |
| 09. | MC/34736 | EPSD 6996 | රතු පැහැති අත් ට්‍රැක්ටරය<br>චැසි අංකය : AT12591200403<br>එන්ජින් අංකය : 19089 | 1,000 | එම |
| 10. | MC/47079 | SF/ 5953 | කොළ පැහැති අත් ට්‍රැක්ටරය<br>චැසි අංකය AC/14 - 0377<br>එන්ජින් අංකය RT/ 140 - 29978 | 1,000 | එම |
| 11. | MC/46584 | SA4782 | රතු පැහැති අත් ට්‍රැක්ටරය<br>චැසි අංකය : AT/003733<br>එන්ජින් අංකය : 003733 | 1,000 | එම |
| 12. | නොමැත | අංක රහිත | ටැෆේ ට්‍රැක්ටර් රථය<br>චැසි අංකය dF81BL-042571<br>එන්ජින් අංකය : 70-6088207 | 1,000 | එම |

12-457

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසුකරුවන් සඳහා නිවේදනය

### ගර්හිත පාලම් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම

ගර්හිත පාලම් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයෙහි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් ලංසු භාරගනු ලබයි. එම ද්‍රව්‍ය ඇති ස්ථාන සහ ප්‍රමාණයන් පහත සඳහන් පරිදිය.

| ස්ථාන | සාමාන්‍ය ප්‍රමාණය |
|---|---|
| 01. මඩු කුෂරයෙහි ඉවතලන පාලම් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | මෙ. ටො. 327.9ක් පමණ |
| 02. මැදවච්චිය - මඩු ව්‍යාපෘතියෙහි ඉවතලන පාලම් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | මෙ. ටො. 232.38ක් පමණ |
| 03. සැ. 50 දම්වැල් 35 සහ සැ. 53 දම්වැල් 31 හි ඉවතලන පාලම් අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | මෙ. ටො. 120.00ක් පමණ |
| එකතුව | මෙ. ටො. 680.28 ක් පමණ |

01 සිට 03 දක්වා වූ අතිතමයන් වෙන වෙනම අගැයීම් කර ප්‍රදානය කරනු ඇත.

02. ලංසු භාරගැනීම 2016.01.05 දින ප. ව. 2.00 ට අවසන් වේ.

03. දුම්රිය සේවා ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත රු. 5,000.00 ක ආපසු ගෙවනු නොලබන ලියකියවිලි ගාස්තුවක් ගෙවීමෙන්, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2016.01.04 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි පෝරමවල ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි වන ලෙස ලංසු තබන්නන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදු කළ යුතු ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදුකළ හැකි ය.

07. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරීගෙන් විමසන්න.

දුරකථන අංක : 2438078/2436818<br>
යොමු අංකය : SRS/F.7290

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(මේජර්)<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

12-627

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය

**රඹුක්කන - කිරිවල්ලපිටිය ඇති පරිහරණයට නුසුදුසු දුම්රිය මැදිරි බැහැර කිරීම**

රඹුක්කන - කිරිවල්ලපිටිය ඇති පරිහරණයට නුසුදුසු දුම්රිය මැදිරි බැහැර කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයෙහි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2016.01.08 වැනි දින ප. ව. 2.00 ට අවසන් වෙයි.

03. දුම්රිය සේවා ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත රු. 3,000.00 ක (රුපියල් තුන්දහසක) ආපසු ගෙවනු නොලබන ලියකියවිලි ගාස්තුවක් ගෙවීමෙන්, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් 2016.01.07 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි පෝරමවල ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදුකෙරේ. ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගිවන ලෙස ලංසු තබන්නන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදුකළ යුතු ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදුකළ හැකි ය.

07. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරීගෙන් විමසන්න.

දුරකථන අංක : 2438078/2436818<br>
ෆැක්ස් අංකය : 2432044

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්).<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,

යොමු අංකය : SRS/F.7245

12-626

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු දැන්වීම

**පහළ දිස්ත්‍රික්කයේ ඇති භාවිතයෙන් ඉවත් කරනලද රේල් පීලි විකිණීම**

කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහළ දිස්ත්‍රික්කයේ, ඇති භාවිතයෙන් ඉවත් කරන ලද රේල් පීලි මෙ. ටො. 625ක් (පමණ) විකිණීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. එම ස්ථාන පහත සඳහන් වේ.

| *ස්ථාන* | *ප්‍රමාණය (දළ වශයෙන්)* | *එම ස්ථානවලට ප්‍රවේශ වීමේ හැකියාව* |
|---|---|---|
| මොරටුව සහ පින්වත්ත අතර | මෙ. ටො. 400 | ළඟාවිය හැක |
| දෙහිවල සහ රත්මලාන අතර | මෙ. ටො. 100 | සීමිත ළඟාවීමේ හැකියාව |
| කොම්පඤ්ඤවීදිය සහ කොල්ලුපිටිය අතර | මෙ. ටො. 125 | සීමිත ළඟාවීමේ හැකියාව |

02. ලංසු භාරගැනීම 2015.01.12 දින ප. ව. 2.00 ට අවසන් වේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 1,00,000.00 (රුපියල් ලක්ෂයක්) ක මුදලක් දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවීමෙන් අනතුරුව 2016.01.11 වැනි දින පෙ. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ලංසු ලිපිලේඛනයන් හි පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් සහභාගි විය හැක.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදු කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරීගෙන් විමසන්න.

දුරකථන අංක : 2438078/2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,

යොමු අංකය : ඉඅඉ/ජ්. 7302

12-628

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ගර්හිත දුම්රිය මැදිරි, වැගන්, එන්ජින් සහ ජංගමක යන්ත්‍ර (Locomotives) අපහරණය

**අංක: එස්ආර්එස්/එෆ්. 7297**

ගර්හිත දුම්රිය මැදිරි, වැගන්, එන්ජින් සහ ජංගමක යන්ත්‍ර (Locomotives) බැහැර කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය මූලස්ථානයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර් ) විසින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| විස්තරය | ස්ථානය | ප්‍රමාණය (සාමාන්‍යයෙන්) |
|---|---|---|
| ගර්හිත වැගන් | රත්මලාන අංගනය | මෙ. ටො. 85.50 |
| ගර්හිත එන්ජින් | රත්මලාන අංගනය | මෙ. ටො. 158.50 |
| ගර්හිත දුම්රිය මැදිරි | මාලිගාවත්ත | මෙ. ටො. 42.00 |
| ගර්හිත ජංගමක යන්ත්‍ර | දෙමටගොඩ ෂොප් 26 | මෙ. ටො. 210.00 |
| එකතුව | | මෙ. ටො. 496.00 |

02. ලංසු භාරගැනීම 2015.12.30 වැනි දින ප. ව. 2.00 ට අවසන් වේ.

03. දුම්රිය ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත රු. 10,000 ක (රුපියල් දස දහසක් පමණයි) ආපසු ගෙවනු නොලබන ලියවිලි ගාස්තුවක් ගෙවීමෙන්, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරියෙන් ලබාගත හැකි පෝරමවල 2015.12.29 දින ප.ව. 3.00 දක්වා ලංසු ඉදිරිපත් කළ හැකිය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කිරීම සිදුකෙරේ. ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කරන වේලාවට පැමිණෙන ලෙස ආරාධනය කරනු ලබයි.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හා අතින් ගෙනැවිත් පහත සඳහන් ලිපිනයට භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී සිදු කළ හැකි ය.

07. වැඩිදු විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී අමතන්න.

දුරකථන අංක : 2438078/2436818
ෆැක්ස් අංක : 2432044
ඊමේල් : srs.str@gmail.com
වෙබ් අඩවිය : www.slrail.info

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,

යොමු අංකය : SRS/F.7297

12-601

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**කොළඹ, දුම්රිය අංගනයේ ගර්හිත දුම්රිය මැදිරි සහ වැගන් සහ රත්මලාන දුම්රිය අංගනයේ සාමාන්‍ය යකඩ සුන්බුන් අපහරණය කිරීම SRS/F. 7300**

කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) හි, සභාපති විසින්, කොළඹ දුම්රිය අංගනයේ මෙට්‍රික් ටොන් 175. 50 ගර්හිත දුම්රිය මැදිරි සහ වැගන් සහ රත්මලාන දුම්රිය අංගනයේ මෙට්‍රික් ටොන් 400 සාමාන්‍ය යකඩ සුන්බුන් අපහරණය කිරීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2015.12.29 වැනි දින ප. ව. 2.00 ට අවසන් වේ.

03. ලංසු, දුම්රිය ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයට ගෙවිය යුතු ආපසු ගෙවනු නොලබන රු. 10,000.00 (රුපියල් දස දහසක) ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2015.12.28 වැනි දින ප. ව. 3.00 දක්වා, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, පමණක් ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ දී විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට පැමිණ සිටින මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ හැකි ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂාකර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී වෙතින් කරුණාකර විමසන්න. (දුරකථන අංක 2432044/2436818).

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමුව : SRS/F. 7300

12-602

---

# බඩු බාහිරාදිය විකිණීම

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - අම්පාර**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක වී ඇති භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්පාර මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වී ඇති නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ හා භාණ්ඩ සමීක්ෂණයේ දී භාවිතයෙන් ඉවත් කරන ලද කාර්යාලීය උපකරණ 2015.12.28 වැනි දින පෙ.ව. 10.00 ට අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන අයෙකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ. ව. 9.15 සිට 9.45 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් එදිනම අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවතින අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

දුමින්ද පී. මුදුන්කොටුව,<br>
දිසා විනිසුරු, සහ මහෙස්ත්‍රාත්,<br>
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
අම්පාර.

2015 නොවැම්බර් මස 26 වැනි දින,<br>
අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| | | |
|---|---|---|
| 01. | AR7792 | ගැල්වනයිස් බට 01යි |
| 02. | 71525 | අංක 5011806 තණකොළ කපන යන්ත්‍රය |
| 03. | 71922 | විදුලි පන්දම් 02යි |
| 04. | 69589 | විදුලි ලන්තෑරුම් 01යි |
| 05. | 70647 | කෝටු මිටි 01යි, ලණු 01යි |
| 06. | | දර තොගයක් |
| 07. | AR7700 | කෝටු මිටි 06යි, 69329921 ලුමාලා පාපැදිය |
| | | 169826575 ලුමාලා පාපැදිය |
| | | 57124026 ලුමාලා පාපැදිය |
| | | 69254257 ලුමාලා පාපැදිය |
| | | 69521014 ලුමාලා පාපැදිය |
| | | 0778106 ලුමාලා පාපැදිය |
| 08. | AR7315 | පාපැදි 01යි |

| | | |
|---|---|---|
| 09. | AR7298 | පාපැදි 01යි |
| 10. | AR7276 | පාපැදි 01යි |
| 11. | AR7256 | පාපැදි 01යි |
| 12. | AR7061 | පාපැදි 01යි |
| 13. | AR7105 | පාපැදි 01යි |
| 14. | AR7079 | පාපැදි 01යි |
| 15. | AR7080 | පාපැදි 01යි |
| 16. | AR7388 | පාපැදි 01යි |
| 17. | AR7473 | පාපැදි 01යි |
| 18. | AR7414 | පාපැදි 01යි |
| 19. | 70320 | පාපැදි 01යි |
| 20. | 70322 | පාපැදි 01යි |
| 21. | 70323 | පාපැදි 01යි |
| 22. | 70324 | පාපැදි 01යි |
| 23. | 70324 | පාපැදි 01යි |
| 24. | 70321 | පාපැදි 01යි |
| 25. | 68920 | පාපැදි 01යි |
| 26. | 64879 | පාපැදි 01යි |
| 27. | 43021 | පාපැදි 01යි |
| 28. | 34721 | පාපැදි 01යි |
| 29. | 46555 | පාපැදි 01යි |
| 30. | AR7943 | අංක UL 751505 පාපැදිය |
| 31. | AR8393 | SM 791511 සිංගර් පා පැදිය |
| 32. | 68638 | වාහන නලා 01 |
| 33. | 56381 | අංක JV - 9714 අත් ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා පමණි) |
| 34. | AR 7707 | 130-0924 හොණ්ඩා වැලි යතුරු පැදිය |
| 35. | AR 6224 | EPM 94299 හීරෝ හොණ්ඩා යතුරුපැදිය |
| 36. | AR 7126 | ලියාපදිංචි නොකළ චැසි අංක MD2DDDA AZZPAA 23104 එන්ජින් අංක DUEPA 44193 CD 100 යතුරුපැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 37. | AR7758 | චැසි අංක T50T 7032210 එන්ජින් අංක අපැහැදිලි මේට් යතුරුපැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 38. | 6220/AR | ලියාපදිංචි නොකළ CCIPLIA 00100119 එන්ජින් අංක 150 TMQI 01337221 යතුරුපැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 39. | 50581 | 46-4025 දරන ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 40. | 70214 | කුළු ගෙඩි 03යි, උදලු 02යි, කුළුගෙඩි 01, ජංගම දුරකථන 02යි |
| 41. | 44815 | කුළුගෙඩි 01යි |
| 42. | අංක රහිත | ගල් කටු 03යි |
| 43. | AR 8382 | නොකියා ජංගම දුරකථනය |
| 44. | 69593 | ජංගම දුරකථන 01යි |
| 45. | 48199 | දම්වැල් කියත් 01යි |
| 46. | 69088 | තට්ටු තරාදි 01යි |
| 47. | 71945 | තට්ටු තරාදි 01යි |

**2014.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වෙන්දේසියට නියමිත භාණ්ඩ**

48. ඉලක්කම් සලකුණු කිරීමේ යන්ත්‍රය 01යි
49. මේස ඔරලෝසු 01යි (අබලන්)
50. කබඩ් (ලාච්චු 04) 02යි
51. කණ්නාඩි (මුහුණ බලන පැරණි) 04යි
52. නාම ලේබන පුවරු 01යි (අධිකරණයේ නම ඉවත් කරන ලද)
53. පුටු (ඇදි සහිත) අබලන් 14
54. හාන්සි පුටු (අබලන්) 01
55. පරිගණක කී බෝඩ් 02යි
56. පරිගණක මවුස් 01යි
57. පරිගණක ස්පිකර් සෙට් 01යි
58. බ්‍රිෆ් කේස් 02යි
59. කෑම මේස පුටු (විනිසුරු නිල නිවසේ ඇති) (අබලන්) 06යි
60. වානේ ඇදි පුටු (අබලන්) 04යි
61. පුටු සෙට් (අබලන්) 01යි
62. පැරණි ඉබි ලොක් 06යි (අබලන්)
63. දුරකථන ඉබිලොක් 01යි (අබලන්)
64. කාර්යාලීය අබලන් දින මුද්‍රා 02යි
65. අබලන් හාන්සි පුටුවක කොටස්
66. වානේ අල්මාරි 02යි
67. වතුර ෆිල්ටර් (අබලන්) 01යි
68. ඇඳන් (සින්ගල්) අබලන් 01යි
69. මෙට්ට (සින්ගල්) (අබලන්) 01යි
70. පරිගණක (යූ. පී. එස්.) 04යි
71. පරිගණක (සී. පී. යූ.) 02යි
72. පරිගණක මොනිටර් 01යි
73. මුද්‍රිත යන්ත්‍ර 02යි
74. වායු සමීකරණ යන්ත්‍ර 01යි
75. විදුලි පංකා (හිටවන) 01යි
76. සිසිල් ශීතකරණ 01යි

12-586

---

මගේ අංකය : ති. ම. අ. භාණ්ඩ වෙන්දේසි.

**තිස්සමහාරාම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය**

: භාණ්ඩ වෙන්දේසි කිරීම

තිස්සමහාරාම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදල රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2015.12.27 වැනි දින පෙරවරු 10.00 ට අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය. එය එදින පෙරවරු 9.30 සිට පෙරවරු 10.00 දක්වා පමණි.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවිය යුතු අතර එවේලේ ම අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

ඉන්දික රුවන් ද සිල්වා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
තිස්සමහාරාමය.

2015 නොවැම්බර් මස 26 වැනි දින,
තිස්සමහාරාම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | BR164/12 | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 02 |
| 02. | BR 166/12 | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 03 |
| 03. | BR 165/12 | එන්ජිම රහිත ෆයිබර් බෝට්ටු | 02 |
| 04. | 16835 | ආපිටෙක් වර්ගයේ වතුර මෝටර් | 01 |
| | | සයිලන්සර් | 01 |
| 05. | 22797 | මට්ටම් ලී | 01 |
| | | මේෂන් හැදි | 01 |
| | | ලඹ කැට | 01 |
| 06. | අංක රහිත | පොල් උල් | 02 |
| 07. | 29688 | සාස්පාන් | 02 |
| 08. | අංක රහිත | වයර් තොගය | |
| 09. | අංක රහිත | කරඩි | 02 |
| 10. | 11824 | කරඩි | 02 |
| 11. | අංක රහිත | අංක T 419557 දරන හීරෝ රෝයල් වර්ගයේ පාපැදි | 01 |
| 12. | අංක රහිත | අංක 3175544 වර්ගය අපැහැදිලි අබලන් පාපැදි | 01 |
| 13. | අංක රහිත | ප්‍රේම් අංක රහිත අබලන් පාපැදි | 01 |
| 14. | අංක රහිත | ASIA වර්ගයේ ප්‍රේම් අංකය රහිත පාපැදි | 01 |
| 15. | අංක රහිත | ප්‍රේම් අංකය රහිත අබලන් පාපැදි | 01 |
| 16. | අංක රහිත | ප්‍රේම් අංකය හා වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 17. | අංක රහිත | HERO වර්ගයේ ප්‍රේම් අංක රහිත අබලන් පාපැදි | 01 |
| 18. | අංක රහිත | වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 19. | අංක රහිත | වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 20. | අංක රහිත | වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 21. | අංක රහිත | ප්‍රේම් අංක NCC 117085 දරන | 01 |
| | | වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 22. | අංක රහිත | ප්‍රේම් අංක X 473304 දරන හීරෝ වර්ගයේ අබලන් පාපැදි | 01 |
| 23. | අංක රහිත | ප්‍රේම් අංක PCI 28397 දරන වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 24. | අංක රහිත | වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 25. | අංක රහිත | ප්‍රේම් අංකය රහිත ROBINSON වර්ගයේ අබලන් පාපැදි | 01 |
| 26. | අංක රහිත | වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 27. | අංක රහිත | ප්‍රේම් අංක A 1157 දරන හීරෝ වර්ගයේ අබලන් පාපැදි | 01 |
| 28. | අංක රහිත | ප්‍රේම් අංක රහිත වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 29. | අංක රහිත | ප්‍රේම් අංක රහිත වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 30. | අංක රහිත | ප්‍රේම් අංක රහිත වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 31. | අංක රහිත | ප්‍රේම් අංක AE 98614 දරන වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 32. | අංක රහිත | ප්‍රේම් අංක AT 22121 දරන වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 33. | අංක රහිත | ප්‍රේම් අංක රහිත වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 34. | අංක රහිත | ප්‍රේම් අංක ACI 7275 දරන වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 35. | අංක රහිත | ප්‍රේම් අංක රහිත SPEED RON වර්ගයේ අබලන් පාපැදි | 01 |
| 36. | අංක රහිත | ප්‍රේම් අංක TCI 49463 දරන වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 37. | අංක රහිත | ප්‍රේම් අංක රහිත වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 38. | අංක රහිත | ප්‍රේම් අංක 892731 දරන අංකය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 39. | AR 193/11 | ප්‍රේම් අංක TCL 26307 දරන වර්ගය නොදන්නා අබලන් පාපැදි | 01 |
| 40. | අංක රහිත | අශ්ව බල 15 පිටත සවිකරන බෝට්ටු එන්ජින් | 02 |
| 41. | 16159 | සුසුකි වර්ගයේ අශ්වබල 15 පිටත සවිකරන බෝට්ටු එන්ජින් | 01 |
| 42. | 16311 | සුදු පැහැති ෆයිබර් ග්ලාස් ඔරු | 01 |
| 43. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ වීදුරු බෝතල් තොගය | |
| 44. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් ගැලුම් | 20 |
| 45. | අංක රහිත | කුඩා ප්‍රමාණයේ යකඩ බැරල් | 05 |
| 46. | අංක රහිත | ප්ලාස්ටික් බෝතල් රඳවන | 18 |
| 47. | අංක රහිත | ප්ලාස්ටික් බැරල් | 01 |
| 48. | 8571 | SPHS 0021 දරන බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය | 01 |

12-480

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මාවනැල්ල

මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපෑ පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2015 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු යොදා ඇත.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි අදාළ වෙන්දේසි භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ දී මිළට ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේ ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් මුදල් ගෙවා එකී භාණ්ඩ එදින ප. ව. 3.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර චෙක් පත් භාරගනු නොලැබේ.

06. සියලුම භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

සී. මීගොඩ,
දිසා/මහෙස්ත්‍රාත් - මාවනැල්ල.

2015 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින,
මාවනැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

2015.12.20 වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලේඛන

| *අනු. අංකය* | *නඩු අංකය* | *වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | නඩු අංක රහිත | හිස් අරක්කු බෝතල් තොගයක |
| 02. | නඩු අංක රහිත | විවිධ වර්ණයෙන් හා විවිධ ප්‍රමාණයෙන් යුත් ප්ලාස්ටික් බූලි තොගයක් |
| 03. | නඩු අංක රහිත | විවිධ දිගින් යුත් රබර් හෝස් තොගයක් |
| 04. | නඩු අංක රහිත | යකඩ මිට සහිත සවල් දහයක් |
| 05. | නඩු අංක රහිත | විවිධ ප්‍රමාණයේ යකඩ බාල්දි දහයක් |
| 06. | 46642 (අනු අංක 01) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 07. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 02) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 08. | 40994 (අනු අංක 03) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 09. | 46775 (අනු අංක 04) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 10. | 47684 (අනු අංක 05) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 11. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 06) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 12. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 07) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 13. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 08) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 14. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 09) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 15. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 10) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 16. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 11) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 17. | B 4598 (අනු අංක 12) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 18. | A 13952 (අනු අංක 13) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 19. | නඩු අංකය අපැහැදිලි (අනු අංක 14) | වර්ගය අපැහැදිලි අත් ට්‍රැක්ටර් මැෂින් එකයි (ලියාපදිංචි කළ නොහැකි අමතර කොටස් සඳහා පමණි) |
| 20. | A 13800 | XR 5818 දරන SAVAGE වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |
| 21. | A 13659 | 117- 6093 දරන YAMAHA වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |
| 22. | 43192 | MU 0410 දරන TVS වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |
| 23. | B 391 | ML 6125 HONDA දරන වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |
| 24. | B 2287 | 154 - 4067 දරන YAMAHA වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |
| 25. | B 2287 | GK 9725 දරන HONDA වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |

| අනු. අංකය | නඩු අංකය | වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ |
|---|---|---|
| 26. | B 4309 | UN - 4914 දරන BAJAJ DISCOVER වර්ගයේ යතුරු පැදි එකයි (ලියාපදිංචි කළ හැක) |
| 27. | 30434 | QP - 0666 දරන BAJAJ වර්ගයේ ත්‍රිරෝද රථ එකයි |
| 28. | B 2905 | GS - 1522 දරන BAJAJ වර්ගයේ ත්‍රිරෝද රථ එකයි |
| 29. | අංකය අපැහැදිලි | QK - 5537 දරන BAJAJ වර්ගයේ ත්‍රිරෝද රථ එකයි |
| 30. | නඩු අංකය අපැහැදිලි | වර්ගය අපැහැදිලි අබලන් පා පැදි එකයි |
| 31. | නඩු අංකය අපැහැදිලි | වර්ගය අපැහැදිලි අබලන් පා පැදි එකයි |
| 32. | B 4725 | SONICCA වර්ගයේ ඇම්ප්ලිපයර් එකයි |
| 33. | B 4725 | ස්පීකර් දෙකක් සහිත අඩි 2 පමණ උස බඟල් දෙකයි |
| 34. | B 4725 | වර්ගය අපැහැදිලි කාර් කැසට් එකයි |
| 35. | B 4725 | ත්‍රිරෝද රථ බඟල් එකයි |
| 36. | A 12905 | OSAKI වර්ගයේ VCD යන්ත්‍ර එකයි |
| 37. | නඩු අංක රහිත | යකඩ තච්චු පහයි |
| 38. | නඩු අංක රහිත | තට්ටු තරාදි කට්ටල එකයි |
| 39. | නඩු අංක රහිත | දුනු තරාදි එකයි |
| 40. | නඩු අංක රහිත | රිම් එක සහිත ත්‍රිරෝද රථ ටයර් එකයි |
| 41. | නඩු අංක රහිත | ලිප් හතරක් ඇති තනි ගෑස් ලිප් එකයි |
| 42. | නඩු අංක රහිත | අබලන් රූපවාහිනී යන්ත්‍ර එකයි |
| 43. | නඩු අංක රහිත | අබලන් පැට්‍රල් ලාම්පු එකයි |
| 44. | නඩු අංක රහිත | අබලන් මේස විදුලි පංකා දෙකයි |
| 45. | නඩු අංක රහිත | විවිධ ප්‍රමාණයේ බෙල්ට් තොගයක් |
| 46. | නඩු අංක රහිත | වාහන අමතර කොටස් තොගයක් |
| 47. | නඩු අංක රහිත | ඇලුමිනියම් කෑලි තොගයක් |
| 48. | නඩු අංක රහිත | ඇලුමිනියම් මුට්ටියක් සහ කල ගෙඩි එකක් |
| 49. | 46747 | ලොකු ඇලුමිනියම් මුට්ටි එකයි |
| 50. | නඩු අංක රහිත | Por Link වර්ගයේ පරිගණක මොනිටර් එකයි. |

12-485

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

නොලංකා ප්‍රෝග්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 ඔක්තෝබර් මස 20 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : නොලංකා ප්‍රෝග්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 109165
ලියාපදිංචි කාර්යාලය : 231 මීගමුව පාර, වත්තල.

නොලංකා ප්‍රෝග්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

12-468

## දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාගතකොට ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : නිපොන් ඔටෝ කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 109416
සංස්ථාගත කළ දිනය : 2015.10.28
ලියාපදිංචි ලිපිනය : 24 එෆ්, ඊස්ට් ටවර්, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01

12-469

## 2007 අංක 07 දරන සමාගම් පනතින් දැන්වීමයි

ඩී කේ ඉම්පෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 109756

ඉහත සඳහන් සමාගම 2015 නොවැම්බර් මස 12 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 26/4 පළමු වැනි පටමුග, පන්නිපිටිය පාර, බත්තරමුල්ල ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

ආර්. එම්. එස්. බී. මැදවෙල මහතා,
අධ්‍යක්ෂක.

12-493

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියලු දෙනාම මෙයින් දැන ගත යුතුයි. කැලණිය, ඊරියවැටිය, ආර්. ඒ. ප්‍රනාන්දු මාවත, අංක 511/ජී දරන ස්ථානයේ පදිංචි, හතුරුසිංහ දේවගේ දර්ශන පුෂ්ප කුමාර (ජාතික හැඳුනුම්පත් අංක 600211897 V) වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි ජනතාවට දන්වා සිටින වගනම්, කැලණිය, පාදිලියාතුඩුව, අංක 77 දරන ස්ථානයේ පදිංචි සුදුවා දේවගේ ලයනල් (ජාතික හැඳුනුම්පත් අංක 562102280 V) යන අය, මගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස පත්කරමින් ප්‍රසිද්ධ නොතාරිස් අයි. මල්ලිකා සුභසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 4868 හා 2007.11.26 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් අවලංගු හා බලරහිත වන බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

හතුරුසිංහ දේවගේ දර්ශන පුෂ්ප කුමාර.

12-496

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එන් ටී සී පවර් සොලුෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 108554
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 51බී/607 සිල්වර්හස්ට් වතු, පිටිපන හංදිය, හෝමාගම
ලියාපදිංචි දිනය : 2015.09.22

සමාගමේ නම : ඩබ්ලිව් පී වර්ධන ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 109291
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 429/ඊ, ඊරියවැටිය, කැලණිය
ලියාපදිංචි දිනය : 2015.10.21

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

12-504

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය තැපැල් වසමේ, මාවිල නිශාන්ත නිවස පදිංචි සන්ධ්‍යා කුමාරි සූරියආරච්චි වන මා, මාරවිල නාත්තන්ඩිය පාර, පදිංචි, ඩී. එච්. එච්. ජයසිංහ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2010.03.15 වැනි දින සහතික කළ අංක 13979 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් නාත්තන්ඩිය, මාවිල පදිංචි, නිශාන්ත ප්‍රියදර්ශී සූරියආරච්චි යන අය මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස පත්කර ඇති අතර, එම ඇටර්නි බලපත්‍රය මෙතැන් පටන් අවලංගු කර නිශ්ප්‍රභා කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු පුරවැසියන්ට මෙයින් දැනුම් දෙමි.

ඒ අනුව එකී ඇටර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග කියනු නොලැබේ.

සන්ධ්‍යා කුමාරි සූරියආරච්චි.

12-513

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සංස්ථාගත කිරීම.

සමාගමේ නම : ඔනැටෝ පවර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 109078
සංස්ථාගත කළ දිනය : 2015 ඔක්තෝබර් 15
ලිපිනය : 214, දෙහිපේ.

ක. දි. වා. මු. ර. හපුහින්න.

12-514

---

## දැන්වීමයි

(2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (3) (බී) වගන්තිය ප්‍රකාර දැන්වීමයි)

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රයිම් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලිවිං හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පූර්ණලෙස අයිතිය සහිත පරිපාලිත සමාගම) ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (මව් සමාගම) සමග ඒකාබද්ධ කිරීම.

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම් වන ප්‍රයිම් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලිවිං හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 2015 නොවැම්බර් මස 20 වැනි දින එක් එක් සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් ලිඛිතව සම්මත කරගැනීම මගින් සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව සමාගම් දෙක ඒකාබද්ධ කිරීමට තීරණය කළ අතර, ඒකාබද්ධ කළ සමාගම ලෙස ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නොකඩවා කටයුතු කරනු ඇත.

මෙම ඒකාබද්ධ කිරීම 2016 ජනවාරි මස 01 වැනි දින සිට හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තීරණය කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 08, ඩී. එස්. සේනානායක මාවත, අංක 75 හි පිහිටි ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි වර්තමාන ලියාපදිංචි කාර්යාලය වේ.

ඒකාබද්ධ කළ සමාගමේ අධ්‍යක්ෂවරුන් වනුයේ ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි වර්තමාන අධ්‍යක්ෂවරුන් වේ.

| | | |
|---|---|---|
| අත්සන් කළේ | අත්සන් කළේ | අත්සන් කළේ |
| බී. ප්‍රේමලාල් මහතා | එච්. කේ. එස්. ආර්. පෙරේරා මිය | බී. ප්‍රේමලාල් මහතා |
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |
| ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ප්‍රයිම් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ලිවිං හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |

12-515

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ, බත්තරමුල්ල, සුභූති මාවතේ, අංක 650/ඒ දරන ස්ථානයේ පදිංචි හේමන්තා කුමුදුනී ජාලත් ඒකනායක (ජා. හැ. අංක 725330359 වී) වන මම, හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස් සුධර්මා රාජපතිරණ විසින් ලියා සහතික කරන ලද අංක 178 සහ වර්ෂ 2006 ක් වූ අප්‍රේල් මස 17 වැනි දින දරන රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලයේ දිනපොත් අංක 6279 යටතේ 328 වෙලුමේ 73 පත්ඉරුවේ 2006.05.17 දින ලියාපදිංචිකර ඇති ඇටෝර්නි බලපත්‍රය මගින් හෝමාගම, පිටිපන උතුර, අංක 161/7 දරන ස්ථනයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ සේනපාල සරත් කුමාර වෙත පවරන ලද බලතල මෙයින් අවලංගුකර බලරහිත කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අද පටන් එකී ඇටර්නි බලපත්‍රය මත ඉහත කී ඇටෝර්නි බලකරු විසින් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ක්‍රියාවන්ට මා වග නොකියන බව ද මෙයින් ප්‍රකාශකර සිටිමි.

හේමන්තා කුමුදුනී ජාලත් ඒකනායක.

2015 නොවැම්බර් මස 11 වැනි දින.
12-523

## ඇටර්නි බලය අවලංගු කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම, පිටිපන උතුර, අංක 167/බී දරන ස්ථානයේ පදිංචි, රත්නායක මුදියන්සේලාගේ සුසන්ත උදය කුමාර (ජා. හැ. අංක 672953235 වී) වන මම, හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස් සුධර්මා රාජපතිරණ විසින් ලියා සහතික කරන ලද අංක 205 සහ වර්ෂ 2008 ක් වූ අගෝස්තු මස 10 වැනි දින දරන, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාප කාර්යාලයේ දින පොත් අංක 6280 යටතේ 1580 වෙලුමේ 18 පත්‍රුවේ 2008.09.05 දින ලියාපදිංචිකර ඇති ඇටර්නි බලපත්‍රය මගින් හෝමාගම, පිටිපන උතුර, අංක 161/7 දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ සේනපාල සරත් කුමාර වෙත පවරන ලද බලතල මෙයින් අවලංගු කර බලරහිත කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

